# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2355/10 - 2023 ඔක්තෝබර් මස 23 වැනි සඳුදා - 2023.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ, මවිසින් 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය වරින්වර සංශෝධනය කරන ලදුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් 2023 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි "අංක 06. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 9 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

10. උක් වගාව සඳහා අවශ්‍ය ජලය අරපිරිමැස්මෙන් භාවිතය සඳහා තාක්ෂණය මුසු වූ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 10 සහ 11 අයිතමයන් පිළිවෙලින් අංක 11 සහ 12 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 5 අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන්;


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

6. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම
7. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
8. කන්තලේ සීනි සමාගම
9. උක් පර්යේෂණ ආයතනය

(ඇ) එහි III වැනි තීරුවෙහි "කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක11)" අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන්;

- උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)

(2) එම නිවේදනයෙහි "අංක 11. ජනමාධ්‍ය අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අංක 10 අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන්;

10. සැලසිනෙ මීඩියා සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී

(3) එම නිවේදනයෙහි "අංක 14. කෘෂිකර්ම අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය සහ එම ශීර්ෂය යටතේ ඇති I, II හා III වැනි තීරු ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් ශීර්ෂය හා I, II හා III වැනි තීරු ඇතුළත් කිරීමෙන්;

**14. කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කෘෂිකර්ම සහ වැවිලි විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනය<br>5. තොග පවත්වා ගැනීම් හා සැපයුම් කටයුතු ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම | 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය<br>4. වී අලෙවි මණ්ඩලය<br>5. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය<br>6. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව<br>7. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය<br>8. ජාතික පොහොර ලේකම් කාර්යාලය<br>9. සීමාසහිත ලංකා පොහොර සමාගම<br>10. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම<br>11. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)<br>12. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය<br>13. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>14. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම් | • කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20)<br>• ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)<br>• ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)<br>• ගස් හෙළීම (පාලන කිරීම) පනත (1951 අංක 9)<br>• බීජ වී පනත (2003 අංක 22)<br>• පස් සංරක්ෂණ පනත (1996 අංක 24)<br>• වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)<br>• ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5) |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 6. භෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>7. දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම<br>8. සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම<br>9. තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරි ගැන්වීම<br>10. රසායනික පලිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව යෙදීම නියාමනය කිරීම<br>11. කෘෂිකාර්මික කටයුතු වල යෙදෙන්නන් සඳහා වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම<br>12. සෘජු නිෂ්පාදකයින්, සැකසුම් ආයතන, තොග වෙළඳ සමාගම සහ අපනයන සමාගම් අතර සැපයුම් සබඳතා ශක්තිමත් කිරීම මගින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබාදීම<br>13. දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු, ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මගින් ස්වභාවික ආපදාවන් අවම කර ගැනීම<br>14. ප්‍රමිතියෙන් යුතු බීජ හා පැළෑටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම<br>15. ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම කළමනාකරණය කිරීම<br>16. කෘෂිකාර්මික සංවර්ධන කලාප, කෘෂි ගම්මාන හා තිරසර ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් ප්‍රචලිත කිරීම<br>17. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නගාසිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>18. කාබනික පොහොර භාවිතය සහ වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැඩසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම | 15. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්<br>16. සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිස් සමාගම<br>17. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන<br>18. ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය<br>19. ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>20. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>21. තේ පර්යේෂණ ආයතනය<br>22. තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය<br>23. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව<br>24. රබර් පර්යේෂණ ආයතනය<br>25. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව<br>26. තේ ශක්ති අරමුදල<br>27. තුරුසවිය අරමුදල<br>28. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>29. ශ්‍රී ලංකා කජු සංස්ථාව<br>30. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය<br>31. පොල් වගා කිරීමේ මණ්ඩලය<br>32. පොල් සංවර්ධන අධිකාරිය<br>33. පොල් පර්යේෂණ ආයතනය<br>34. තල් සංවර්ධන මණ්ඩලය<br>35. කිතුල් සංවර්ධන මණ්ඩලය<br>36. කප්රුක අරමුදල | • කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)<br>• රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1972 අංක 11)<br>• පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)<br>• පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)<br>• පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)<br>• ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 18)<br>• සත්ත්ව රෝග පනත (1992 අංක 59)<br>• සත්ත්ව ආහාර පනත (1986 අංක 15)<br>• සත්ත්ව පනත (1958 අංක 29)<br>• පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)<br>• ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය පනත (1979 අංක 45)<br>• තේ, රබර් සහ පොල්වතු (කැබලි කිරීම පාලන) පනත (1958 අංක 2)<br>• ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය (1975 අංක 14)<br>• තේ පාලන පනත (1957 අංක 51)<br>• තේ සහනාධාර පනත (1958 අංක 12)<br>• තේ (බදු හා අපනයන පාලනය) පනත (1959 අංක 16)<br>• තේ පර්යේෂණ මණ්ඩල පනත (1993 අංක 52)<br>• තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)<br>• කුඩා තේ වතු සංවර්ධන පනත (1975 අංක 35) |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 19. ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදාහැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම<br>20. නියමිත ප්‍රමිතියෙන් යුත් රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම<br>21. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම<br>22. දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයේ සාධාරණ මිළ ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>23. ගෙවතු වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>24. අතිරික්ත නිෂ්පාදනය ගබඩා කිරීමසඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කිරීම<br>25. කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම<br>26. ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම<br>27. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම<br>28. රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය<br>29. දේශීය නිෂ්පාදනය වැඩිකිරීම තුළින් ආහාර භෝග ආනයනය අවම කිරීම<br>30. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම<br>31. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු<br>32. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම | | • රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත (1953 අංක 36)<br>• රබර් පර්යේෂණ මණ්ඩල ආඥාපනත (1930 අංක 10)<br>• රබර් පාලන පනත (1956 අංක 11)<br>• තුරුසවිය අරමුදල් පනත (2000 අංක 23)<br>• අපනයන කෘෂි සංවර්ධන පනත (1992 අංක 46)<br>• පොල් සංවර්ධන පනත (1971 අංක 46)<br>• පොල් පර්යේෂණ මණ්ඩල පනත (1950 අංක 37)<br>• කප්රුක අරමුදල් පනත (2005 අංක 31)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 33. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු | | |
| 34. විවිධ භූගෝලීය අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළ සංවර්ධනය දිරි ගැන්වීම | | |
| 35. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම | | |
| 36. මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපලවල් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම | | |
| 37. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පාරිභෝජන අවස්ථා පුළුල් කිරීම | | |
| 38. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය | | |
| 39. දේශීය ගොවි නිෂ්පාදන සඳහා වෙළඳපල පුළුල් කිරීම | | |
| 40. සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රට තුළ වගා කිරීම සඳහා කටයුතු කිරීම | | |
| 41. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය | | |
| 42. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරගකාරිත්වය ඉහළ නැංවීම | | |
| 43. ජාත්‍යන්තර වෙළඳපල ඉලක්ක කරගත් වැවිලි බෝග මත පදනම් වූ අගය එකතු කල නිෂ්පාදන සම්බන්ධ කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 44. තේ, රබර් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු | | |
| 45. තේ, රබර් හා පොල් වතු කැබලි කර ජනාවාස ඉදිකිරීම උපරිම වශයෙන් සීමා කිරීම | | |
| 46. වැවිලි භෝග කර්මාන්ත සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම වැඩි කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 47. කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන් දිරිගැන්වීම තුළින් රබර් නිෂ්පාදන කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සුලබ කිරීම | | |
| 48. තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම | | |
| 49. ග්‍රාමීය තේ වගාව ප්‍රවර්ධනය හා කුඩා තේ වතු හිමියන් දිරිගැන්වීම | | |
| 50. තේ අපනයනය සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම | | |
| 51. රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශයේම සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකා තේ (Ceylon Tea) සඳහා ජාත්‍යන්තර තේ වෙළඳපොල පුළුල් කිරීම | | |
| 52. රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම්ද ඇතුළත්ව ආශ්‍රිත භෝග වගා කටයුතු වර්ධනය කිරීම | | |
| 53. දේශීය හා විදේශීය වෙළඳපොල ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම | | |
| 54. වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම | | |
| 55. තේ, රබර් හා පොල් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම | | |
| 56. කුඩා වැවිලි භෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම | | |
| 57. පර්යේෂණ ආයතනයන් හා ඒකාබද්ධව වැඩි අස්වනු සහිත ප්‍රභේද ගොවියන් වෙත හඳුන්වා දීමට ක්‍රියා කිරීම | | |
| 58. නවීන තාක්ෂණයද භාවිතා කරමින් දේශීය නිෂ්පාදනවල අගය එකතු කිරීම තුලින්, ඉහල වටිනාකමකින් යුත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම, අපනයන වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම | | |
| 59. සුළු වැවිලි භෝග කර්මාන්ත සුරක්ෂිතභාවය ඇති කරමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරීම සඳහා පියවර ගැනීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 60. කුඩා වැවිලි බෝග වගා කටයුතු සඳහා ගුණාත්මක භාවයෙන් යුත් බීජ හා පැල ලබාදීම මගින් ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම | | |
| 61. අගය එකතු කල නිෂ්පාදනය ද ඇතුලුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම | | |
| 62. කුරුඳු, ගම්මිරිස්, වැනි දේශීය බෝග වර්ග ප්‍රති අපනයනය වෙනුවට ශ්‍රී ලංකා සන්නාමය සහිතව අපනයන වෙළඳපළ සඳහා දියුණු කිරීම | | |
| 63. කුඩා වැවිලි භෝග සඳහා අපනයන ගම්මාන පිහිටුවීම | | |
| 64. පොල්, කිතුල් හා තල්ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ ඊට අදාළ පර්යේෂණයන්ට අදාළ කටයුතු | | |
| 65. දේශීය පොල් ඉල්ලුම සපුරාලීමටත් පොල්, තැඹිලි, කුරුම්බා ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහාත් ක්‍රමෝපායන් සැකසීම | | |
| 66. බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම | | |
| 67. භූගෝලීය සාධකද සැලකිල්ලට ගෙන අධි ඵලදාවක් සහිත පොල් පැල ප්‍රභේද හඳුන්වා දීම | | |
| 68. දේශීය හා විදේශීය වෙළඳපල ඉලක්ක කරගනිමින්, නව තාක්ෂණයද මුසු වූ අගය එකතු කල පොල්, කිතුල් හා තල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම | | |
| 69. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 70. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(4) එම නිවේදනයෙහි "අංක 18. වැවිලි කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය සහ එම ශීර්ෂය යටතේ ඇති I, II හා III වැනි තීරු ඉවත් කිරීමෙන්;

EOG 10-0254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.